From
the People of Japan

## ජපන් තානාපති කාර්යාලය

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

## පුවත්පත් නිවේදනය

මාර්තු 14, 2014

## සර්වෝදය සුවසෙත සංගමය සඳහා ජපන් රජයෙන් රුපියල් මිලියන 14 ක ආධාරයක්

ජපන් රජයේ බිම් මට්ටමේ මානව ආරක්ෂණය උදෙසා ආධාර ව්‍යාපෘතිය මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ බාලිකා නිවාසය නඟාසිටුවීමේ ව්‍යාපෘතියට ඇමරිකානු ඩොලර් 111,113 (දළ වශයෙන් මිලියන දාහතරක්) ක මුදලක් පරිත්‍යාග කරන ලදි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බාලිකා නිවාසය නඟා සිටුවීමේ ව්‍යාපෘතිය යටතේ මහල් 02 ක ගොඩනැඟිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම, පෙර පාසලක් හා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදි කිරීම හා වාරියපොල බාලිකා නිවාසයේ සෞඛ්‍ය, ආරක්ෂාව හා අධ්‍යාපනික පසුබිම ඉහල නැංවීමට අවශ්‍ය අනෙකුත් උපකරණ මිලදී ගැනීම සිදු කරනු ලැබේ. වාරියපොල බාලිකා නිවාසය 'සුඟිරා බ්‍රහ්මචාරී පදනම' හි ආධාර මඟින් සර්වෝදය සුවසෙත පදනම මඟින් පවත්වාගෙන යනු ලැබේ.

වාරියපොල බාලිකා නිවාසය මඟින් මේ වන විට බාලිකාවන් 43 ක් වඩාත් ඵලදායි කුසලතා වලින් පරිපූර්ණ පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහාත්, ඔවුන්ගේ මානසික හා ශාරීරික සුවතාවය ඉහල නැංවීමට කටයුතු කරන අතර ප්‍රදේශයේ සිටින අඩු ආදායම් ලබන පවුල් වල ළමයින් සඳහා ගුණාත්මක අධ්‍යාපනික වටපිටාවක් ඇති කරලීම සඳහා වෘත්තිය පුහුණු සහ පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙනු ලැබේ.

සර්වෝදය ජාතික ශ්‍රමදාන සංගමයේ ගරු සභාපති ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා සහ සර්වෝදය සුවසෙත සංගමයේ ගරු මහලේකම් නීතා ආරියරත්න මහත්මිය පැවසුවේ මෙම ව්‍යාපෘතිය යටතේ ලැබෙන පහසුකම් මඟින් ළමයින්ට හා බාලිකාවන්ට වඩාත් ඉහල

සේවාවක් ලබා දීමට හැකි වන බවත්, වයඹ පළාතේ මව්වරුන් රැකියා සඳහා පිටරට යෑමේ තත්වය තුල අසරණ වන ළමයින්ගේ සුභ සිද්ධිය සඳහා මෙමඟින් කටයුතු කල හැකි බවත්ය. මෙම බාලිකා නිවාසය වයඹ පළාතේ පරිවාස හා ළමාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ පූර්ණ විමර්ශනය යටතේ ක්‍රියාත්මක වේ.

ජපන් තානාපති නොබිහිතෝ හෝබෝ මහතාත්, සර්වෝදය සුවසෙත සංගමයේ ගරු මහලේකම් නිතා ආරියරත්න මහත්මිය අතරත් 2014 මාර්තු 14 වන දින තානාපති නිල නිවසේදි මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලදි.


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය
දුරකථන 011-2693831 දිගු අංකය 225
ඊ මේල් : cultujpn@co.mofa.go.jp